# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2018.07.10

කරු ජයසූරිය මැතිතුමා,
ගරු කථානායක තුමා,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධන පුර,
කෝට්ටෙ.

ගරු කථානායක තුමනි,

<u>පළාත් සභා සීමා නීර්ණ වාර්තාව පාර්ලිමෙන්තුවේ සම්මත වීම ප්‍රමාද වීම</u>

නව පළාත් සභා මැතිවරණ ක්‍රමය හඳුන්වාදීමේදී එය ක්‍රියාත්මක විය යුතු කාල රාමුවක් ඇතුලත් කිරීම පිළිබඳව අප බෙහෙවින් සතුටට පත් වූ අතර ඒ සම්බන්ධයෙන් කථානායක වරයා ලෙස ඔබ තුමාගේ මැදිහත් වීමද බෙහෙවින් අගය කළෙමු.

එහෙත් මේ වන විට පාර්ලිමේන්තුව විසින්ම සම්මත කරන ලද පනත ප්‍රකාරව කටයුතු කිරීමට පාර්ලිමේන්තුව අපොහොසත් වී ඇත. එය ඉතාම කණගාටුදායක තත්ත්වයකි. එයට බලපෑ දේශපාලනික හේතු කාරණා තිබිය හැකි වුවද ව්‍යවස්ථාදායකය හා එහි නියෝජිතයන් පිළිබඳ ජනතාවගේ විශ්වාසය පලුදු වීම හරහා ජනතා පරමාධිපත්‍ය බලය හැල්ලුවට ලක්වීම මගින් ප්‍රජාතන්ත්‍රවාදී යහ පැවැත්මට ද එල්ල වනුයේ බලවත් හානියකි.

මේ සඳහා ආණ්ඩු පක්ෂය, ඇතුළු සියළු දේශපාලන පක්ෂ නායකයින් සහ පාර්ලිමේන්තුවේ සියළු මහජන නියෝජිතයන් වගකිව යුතු අතර පාර්ලිමේන්තුවේ ප්‍රධානියා ලෙස ඔබ තුමාට ද එම වගකීමෙන් බැහැර විය නොහැක. එබැවින් පහත සඳහන් කරුණු කෙරෙහි ඔබ තුමාගේ විශේෂ අවධානය යොමු කරන ලෙසත්, ජනතාවගේ දැන ගැනීම සඳහා එම තොරතුරු අප වෙත ලබාදීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමු.

01. සීමා නීර්ණය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවේ කවදා ද?
02. එම වාර්තාව පාරලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුලත් කළ ද, සම්මත නොකිරීමට බලපෑ හේතු සාධක කවරේද?
03. වාර්තාව මසක් ඇතුලත සම්මත නොවුනහොත් පත්කළ යුතුව තිබූ කමිටුව පත් නොකිරීමට හේතු වූ කරුණු කවරේද?
04. ඉදිරියේදී එම කමිටුව පත් කිරීමට හැකියාව තිබේද? එසේ නම් එම කටයුතු අවසන් කිරීමට කොපමණ කාලයක් ගතවේද?
05. පළාත් සභා මැතිවරණය පවත්වනු ලබන නිශ්චිත කාල වකවානුව කුමක්ද?

මෙම විමසීම හුදෙක්ම ඡන්ද අයිතිය සුරක්ෂිත කිරීම අරභයා වන අතර ජනතා පරමාධිපත්‍යයේ මූලිකාංගයක් වන ඡන්ද බලය සුරක්ෂිත කරදී ඒ හරහා තම නියෝජිතයින් මගින් පාලන කටයුතුවලට සම්බන්ධ වීමට පුරවැසියන් හට ඇති අනුලංගනීය අයිතිය සුරක්ෂිත කරදීම වෙනුවෙන් අවැසි මැදිහත් වීම ඔබතුමා විසින් සිදුකරනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වන අතර එකී තත්ත්වයන්හිදී නිරීක්ෂණ සංවිධානයක් ලෙස අවැසි උපරිම සහයෝගය ඔබ තුමා වෙත ලබාදෙන බවද අවසන් වශයෙන් දන්වනු කැමැත්තෙමු.
ස්තුතියි.
මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,
විධායක අධ්‍යක්ෂ.

# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2514441 / 11 2514442 Fax: (+94) 11 2514443
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk